මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2022.08.16 |

# සේවා අපනයන ලැබීම්/ඉපැයීම් අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය ලිහිල් කිරීම

තම අපනයන ඉපැයීම් රට තුළට ගෙන ඒම සඳහා සේවා අපනයනකරුවන් දිරිමත් කිරීමේ අදහසින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, 2022 අගෝස්තු 12 වන දින හෝ ඉන් පසුව ශ්‍රී ලංකාව වෙත ලැබෙන සේවා අපනයන ලැබීම්/ ඉපැයීම් අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය ඉවත් කර ඇත. සේවා අපනයනකරුවන් හට ශ්‍රී ලංකාව වෙත රැගෙන ආ ඔවුන්ගේ අපනයන ඉපැයීම් අවසරලත් කාර්යයන් සඳහා භාවිතා කළ හැකිය. සේවාව ලබාදුන් දින සිට දින 180 ක් ඇතුළත සේවා අපනයන ඉපැයීම් රට තුළට ලබා ගැනීමේ අනිවාර්යය අවශ්‍යතාවය නොවෙනස්ව පවතී.

බැංකු විසින් වාර්තා කරනු ලබන තොරතුරුවලට අනුව, 2022 වසරේ පළමු මාස 6 තුළ දී සේවා අපනයන ලැබීම් ලෙස එ. ජ. ඩොලර් මිලියන 1,533 ක ප්‍රමාණයක් මෙරටට ලැබී ඇති අතර ඉන් එ.ජ. ඩොලර් මිලියන 406 ක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කර ඇත. 2022 මාර්තු මාසයේ දී, ඉහළම මාසික සේවා අපනයන ඉපැයීම් වන එ.ජ. ඩොලර් මිලියන 324 ක මුදල ලැබී තිබුණි. සේවා අපනයනකරුවන්ගේ නියෝජිතයින් සමඟ පැවැත් වූ සාකච්ඡාවල දී ඔවුන් විසින් අපනයන ලැබීම් තවදුරටත් ඉහළ නැංවීමේ හැකියාව ඉස්මතු කරන ලදී.

අපනයන ඉපැයීම් දින 180 ක් තුළ දී ගෙන ඒමේ අනිවාර්ය අවශ්‍යතාවය වෙත අවධානය යොමු කරමින්, සියලුම අපනයන ඉපැයීම් මෙම අවශ්‍ය මොහොතේ රටට ගෙන්වා ගැනීමට සියලුම අපනයනකරුවන් දිරිමත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපනයනකරුවන් සහ අවසරලත් වෙළෙඳුන් විසින් අදාළ අවශ්‍යතාව සමඟ අනුකූල වීම අධීක්ෂණය කිරීමේ කටයුතු තීව්‍ර කර ඇත.

ඉහත සඳහන් ලිහිල් කිරීම සම්බන්ධ වැඩිදුර විස්තර, www.dfe.lk හරහා 2022 අගෝස්තු 12 දිනැති අංක **2292/50 දරන ගැසට් (අති විශේෂ) නිවේදනයේ** පළකර ඇති "**2022 අංක 02 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ රීති**" වෙත යොමු වීමෙන් ලබා ගත හැකිය.